

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඊ (1) ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරනු ලබන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පස්වැනි වාර්තාව

2025 ජනවාරි සිට ජූනි දක්වා කාල පරිච්ඡේදය සඳහා

இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் அரசியலமைப்பின் 41எ(1) எனும் உறுப்புரையின் கீழ் சமர்ப்பிக்கப்படும் அரசியலமைப்புப் பேரவையின் ஐந்தாவது அறிக்கை

2025 ஆம் ஆண்டு ஜனவரி மாதம் முதல் ஜூன் மாதம் வரையான காலப்பகுதிக்கானது

The Fifth Report of the Constitutional Council submitted under Article 41G (1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka

For the period from January to June 2025

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරනු ලබන,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පස්වැනි වාර්තාව

2025 ජනවාරි සිට ජූනි දක්වා කාල පරිච්ඡේදය සඳහා

අන්තර්ගතය

1. හැඳින්වීම 1

2. සභාවේ රැස්වීම් 1

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම් 1

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව යටතේ දක්වා ඇති සභාවේ කාර්යය සහ කර්තව්‍යය 1

4.1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව 1

4.2. සීමා නිර්ණය කොමිෂන් සභාව 2

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාව යටතේ සභාවේ කාර්යය සහ කර්තව්‍යය 3

5.1. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර ධුරය සඳහා පත් කිරීම 3

5.2. අභියාචනාධිකරණයේ සභාපති ධුරය සඳහා පත් කිරීම 3

5.3. අභියාචනාධිකරණයේ විනිශ්චයකාර ධුරය සඳහා පත් කිරීම 4

5.4. විගණකාධිපති ධූරය සඳහා පත් කිරීම 5

6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර වෙනත් ලිඛිත නීති මඟින් සභාව වෙත පනවන ලද හෝ පවරන ලද කාර්ය සහ කර්තව්‍යයන් ඉටු කිරීම 6

6.1. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට සාමාජිකයින් පත් කිරීම 6

6.2. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට **(OMP)** සාමාජිකයින් පත් කිරීම 6

6.3. හානිපූරණය සඳහා වන කාර්යාලයට සාමාජිකයින් පත් කිරීම 7

6.4. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික තනතුරට පත් කිරීම 7

6.5. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම 8

6.6. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම සඳහා සභාවේ නිර්දේශය 9

6.7. කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට සාමාජිකයින් පත් කිරීම 9

7. සභාවේ කාර්යය සහ කර්තව්‍යයන් කිරීම සහ ඉටු කිරීම සම්බන්ධ රීති සම්පාදනය කිරීම 10

8. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ යොමු කරනු ලබන තොරතුරු ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම 11

9. සභාවේ සාමාජිකයන් වගඋත්තරකරුවන් ලෙස සඳහන් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරනු ලැබ ඇති මූලික අයිතිවාසිකම් අයදුම්පත්:- 11

1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (මෙහි මින් ඉදිරියට 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව' ලෙසද හැඳින්වෙන) විධිවිධාන යටතේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත (මෙහි මින් ඉදිරියට 'සභාව' ලෙසද හැඳින්වෙන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අනෙකුත් නීති මගින් පවරා ඇති කාර්යය සහ කර්තව්‍යය කිරීමට සහ ඉටු කිරීමට බලය පවරනු ලැබ ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඵ (1) ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව 2025 ජනවාරි සිට ජුනි දක්වා කාල පරිච්ඡේදය තුළ සභාව විසින් කරන ලද සහ ඉටු කරන ලද කටයුතු මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කරනු ලැබේ.

2. සභාවේ රැස්වීම්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, සමාලෝචිත කාල සීමාව තුළ, පහත දිනයන් හිදී අවස්ථා විස්සකදී (20) රැස්විය:-

2025.01.03, 2025.01.07, 2025.01.10, 2025.01.23, 2025.02.05, 2025.02.14, 2025.02.16, 2025.02.19, 2025.03.05, 2025.03.06, 2025.03.11, 2025.03.12, 2025.03.28, 2025.04.22, 2025.05.08, 2025.05.20, 2025.05.21, 2025.05.22, 2025.06.13, 2025.06.18

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම්

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද 2025 මැයි 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිය ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය, සභාව විසින් 2025 මැයි 08 වැනි දින පැවති සිය රැස්වීමේ දී සලකා බලන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම්, ධම්මික දසනායක මහතා විසින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්, පාර්ලිමේන්තු සභාවේ ලේකම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම් ලෙස කරන ලද දීර්ඝ සේවය සභාව විසින් ප්‍රශංසාවට ලක් කරන ලදී.

- එම රැස්වීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම් ධුරය සඳහා සුදුසු/ස්ථිර පත් කිරීමක් සිදු කරන තෙක්, 2025 මැයි 14 වන දින සිට සභාවේ මහ ලේකම් ධුරයේ වැඩ බැලීම සඳහා පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් හංස අබේරත්න මහතා පත් කිරීමට සභාව විසින් ඒකමතිකව තීරණය කර පත් කරන ලදී.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව යටතේ දක්වා ඇති සභාවේ කාර්යය සහ කර්තව්‍යය

4.1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව

- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම සඳහා 2025.01.07 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ඇගයීම් වාර්තාව, 2025 ජනවාරි 23 වැනි දින පැවති සිය රැස්වීමේදී සභාව විසින් සලකා බලන ලදී.

ඊට අනුකූලව, අයදුම්කරුවන්ගේ සුදුසුකම්, නිසි සහ යෝග්‍යතාව මෙන්ම කොමිෂන් සභාවේ වත්මන් සංයුතියේ විෂය පථයට අයත් විවිධ වෘත්තීමය සේවාවන්හි නියෝජනයන් ද සලකා බැලූ සභාව විසින්, චන්ද්‍රරත්න පල්ලේගම මහතාගේ ඉල්ලා අස්වීම මත පුරප්පාඩු වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරය සඳහා ඉංජිනේරු (ආචාර්ය) ප්‍රීති සනත් පනාවැන්නගේ මහතාගේ නම නිර්දේශ කිරීමට ඒකමතිකව තීරණය කරන ලදී.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 (4) ව්‍යවස්ථාව යටතේ, එන්. එච්. එම්. චිත්‍රානන්ද මහතා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයෙන් ඉවත් කිරීම සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිමින් ජනාධිපති ලේකම්වරයා විසින් සභාවට එවන ලද සන්නිවේදනය, 2025 පෙබරවාරි 19 වන දින පැවති සිය රැස්වීමේදී සභාව විසින් සලකා බලන ලදී.

- ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සහ දක්වා ඇති හේතු සලකා බැලීමෙන් අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (5) සහ 54 (4) ව්‍යවස්ථා යටතේ එන්. එච්. එම්. චිත්‍රානන්ද මහතා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයෙන් ඉවත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශය, සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

- ඉහත සඳහන් ඉවත් කිරීම හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඇති වූ පුරප්පාඩුව අවධානයට ගනු ලැබූ සභාව විසින්, එම පුරප්පාඩුව සඳහා නව පුවත්පත් දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවීමට තීරණය කරන ලදී.

- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති සනත් ජයන්ත එදිරිවීර මහතා විදේශගත වීමට නියමිත 2025.03.02 සිට 2025.03.14 දක්වා කාල පරිච්ඡේදය තුළ කොමිෂන් සභාවේ සභාපති ධුරයේ වැඩ බැලීමට පත් කිරීම සඳහා සුදුසු නිර්දේශයක් ඉල්ලා සිටිමින් ජනාධිපති ලේකම්වරයාගෙන් ලැබුණු සන්නිවේදනය, 2025 මාර්තු 05 වන දින පැවති සිය රැස්වීමේදී සභාව විසින් සලකා බලනු ලැබූ අතර එම කාලය තුළ සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වන මහාචාර්ය එන්. සෙල්වක්කුමරන් මහතා කැමැත්ත පළ කර ඇති බව තවදුරටත් සභාවට දන්වන ලදී.

  ඊට අනුකූලව, සභාව විසින්, සලකා බැලීමෙන් අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ (1) සහ 41 ආ (2) ව්‍යවස්ථා යටතේ, කොමිෂන් සභාවේ සභාපති සනත් ජයන්ත එදිරිවීර මහතා විදේශ ගතවීමට නියමිත 2025.03.02 සිට 2025.03.14 දක්වා කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා මහාචාර්ය එන්. සෙල්වක්කුමරන් මහතා පත් කිරීමට ඒකමතිකව නිර්දේශ කරන ලදී.

4.2. සීමා නිර්ණය කොමිෂන් සභාව

- සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා පත් කිරීම පිළිබඳ 2025.01.10 දිනැති ජනාධිපති ලේකම්වරයාගේ සන්නිවේදනය, 2025 ජනවාරි 23 වැනි දින පැවති රැස්වීමේදී සභාව විසින් අවධානය යොමු කරන ලදී. ඊට අනුකූලව, සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජික ආචාර්ය ඒ. ඩී. බණ්ඩාරනායක මහත්මිය 2025.01.20 සිට

2025.02.13 දක්වා කාල පරිච්ඡේදය තුළ සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා සභාව විසින් නිර්දේශ කරන ලදී.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාව යටතේ සභාවේ කාර්යය සහ කර්තව්‍යය

5.1. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර ධුරය සඳහා පත් කිරීම

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) සහ 107 ව්‍යවස්ථා යටතේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ධුරයේ පවතින පුරප්පාඩු සඳහා අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන් වන ගරු විනිශ්චයකාර ආර්. එම්. සෝභිත රාජකරුණා මහතා, ගරු විනිශ්චයකාර මේනකා විජේසුන්දර මහත්මිය, ගරු විනිශ්චයකාර එස්. බී. අබයකෝන් මහතා සහ ගරු විනිශ්චයකාර එම්. එස්. කේ. බී. විජේරත්න මහතා පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශයන් පිළිබඳව සභාව විසින් 2025 ජනවාරි 10 වැනි දින පැවති රැස්වීමේදී සලකා බලන ලදී.

  ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ඇ (4) ව්‍යවස්ථාව යටතේ, ගරු අග්‍රවිනිශ්චයකාරතුමිය වෙතින් ලබා ගත් අදහස් සහ නාමිකයන්ගේ සුදුසුකම් සහ ජ්‍යෙෂ්ඨත්වය සලකා බැලීමෙන් අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ඇ (1) ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ධුරයේ පුරප්පාඩු සඳහා අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන් වන ගරු විනිශ්චයකාර ආර්. එම්. සෝභිත රාජකරුණා මහතා, ගරු විනිශ්චයකාර මේනකා විජේසුන්දර මහත්මිය, ගරු විනිශ්චයකාර එස්. බී. අබයකෝන් මහතා සහ ගරු විනිශ්චයකාර එම්. එස්. කේ. බී. විජේරත්න මහතා පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශ සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

5.2. අභියාචනාධිකරණයේ සභාපති ධුරය සඳහා පත් කිරීම

- ගරු ජනාධිපතිතුමා විසින් 2025.02.01 දින සිට 2025.06.15 දින දක්වා අභියාචනාධිකරණයේ වත්මන් සභාපති ගරු විනිශ්චයකාර එන්. බී. පී. ඩී. එස්. කරුණාරත්න මහතා වෙත විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගැනීමට අනුමැතිය ලබා දී ඇති බැවින්, 2025.02.16 දින සිට 2025.06.15 දින දක්වා කාල පරිච්ඡේදය තුළ අභියාචනාධිකරණයේ සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා අභියාචනාධිකරණ විනිශ්චයකාර ගරු එම්. ටී. එම්. ලෆාර් මහතා පත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (2) සහ 109 (1) ව්‍යවස්ථා යටතේ ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශයක් සභාව විසින් සලකා බලන ලදී.

  ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ඇ (4) යටතේ ගරු අග්‍රවිනිශ්චයකාරතුමිය වෙතින් ලබා ගන්නා ලද අදහස් සමඟ එහි ඇතුළත් කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් ද සභාව විසින් සලකා බලන ලදී.

  2025 පෙබරවාරි 16 වන දින පැවති රැස්වීමේදී, මේ පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභියාචනාධිකරණයේ වත්මන් සභාපති ගරු විනිශ්චයකාර එන්. බී. පී. ඩී. එස්. කරුණාරත්න මහතා වෙත විශ්‍රාම පූර්ව නිවාඩු ලබා දී ඇති 2025.02.16 දින සිට 2025.06.15 දින දක්වා කාල පරිච්ඡේදය සඳහා අභියාචනාධිකරණ විනිශ්චයකාර ගරු එම්. ටී. එම්. ලෆාර් මහතා අභියාචනාධිකරණයේ සභාපති ධුරයේ වැඩ බැලීමට පත් කිරීම සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය අනුමත කිරීමට සභාවේ බහුතරය විසින් තීරණය කරන ලදී.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) සහ 107 (1) ව්‍යවස්ථා යටතේ, අභියාචනාධිකරණයේ සභාපති ධුරය සඳහා ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ නලින් රොහාන්ත අබේසූරිය මහතා පත් කිරීමට ගරු ජනාධිපතිතුමා කළ නිර්දේශය 2025 ජුනි 18 වන දින පැවති සිය රැස්වීමේදී, සභාව විසින් සලකා බලන ලදී.

  එකී නිර්දේශය සමඟ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (4) ව්‍යවස්ථාව යටතේ අග්‍රවිනිශ්චයකාරතුමිය වෙතින් ලබා ගත් අදහස් සලකා බැලීමෙන් අනතුරුව, සභාව විසින්, අභියාචනාධිකරණයේ සභාපති ධුරය සඳහා ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්, ජනාධිපති නීතිඥ නලින් රොහාන්ත අබේසූරිය මහතා පත් කිරීමට ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ ඒකමතිකව අනුමත කරන ලදී.

5.3. අභියාචනාධිකරණයේ විනිශ්චයකාර ධුරය සඳහා පත් කිරීම

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණයේ විනිශ්චයකාර ධුරයේ පුරප්පාඩු සඳහා මහාධිකරණ විනිශ්චයකාර කේ. එම්. එස්. දිසානායක මහතා සහ මහාධිකරණ විනිශ්චයකාර ආර්. පී. හෙට්ටිආරච්චි මහතා පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා වෙතින් ලද නිර්දේශ සභාව විසින් සලකා බලන ලදී.

  ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (4) ව්‍යවස්ථාව යටතේ ගරු අග්‍රවිනිශ්චයකාරතුමිය වෙතින් ලබා ගන්නා ලද අදහස් සහ නාමිකයන්ගේ සුදුසුකම් සහ ජ්‍යෙෂ්ඨත්වය සලකා බැලීමෙන් අනතුරුව, 2025 ජනවාරි 03 වැනි දින පැවති සිය රැස්වීමේදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණයේ විනිශ්චයකාර ධුරයේ පුරප්පාඩු සඳහා මහාධිකරණ විනිශ්චයකාර කේ. එම්. එස්. දිසානායක මහතා සහ මහාධිකරණ විනිශ්චයකාර ආර්. පී. හෙට්ටිආරච්චි මහතා පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශ සභාව විසින් අනුමත කරන ලද අතර එක් සාමාජිකයකු විසින් තීරණය අනුමත කිරීම හෝ නොකිරීමෙන් වැළකී සිටින ලදී.

- 2025 මාර්තු 05 වැනි දින පැවති සිය රැස්වීමේදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ, පුරප්පාඩු වූ අභියාචනාධිකරණයේ විනිශ්චයකාර ධුරය සඳහා මහාධිකරණ විනිශ්චයකාරවරයන් වන ඩබ්ලිව්. කේ. එස්. යූ. ප්‍රේමචන්ද්‍ර මහතා, කේ. ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා සහ ඒ. ප්‍රේමශංකර් මහතා පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශ සභාව විසින් සලකා බලන ලදී.

  ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (4) ව්‍යවස්ථාව යටතේ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශ, අග්‍රවිනිශ්චයකාරතුමිය වෙතින් ලබා ගත් අදහස් සමඟ සලකා බැලූ සභාව විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණයේ විනිශ්චයකාර ධුරය සඳහා මහාධිකරණ විනිශ්චයකාරවරුන් වන ඩබ්ලිව්. කේ. එස්. යූ. ප්‍රේමචන්ද්‍ර මහතා, කේ. ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා සහ ඒ. ප්‍රේමශංකර් මහතා පත් කිරීම සඳහා වූ නිර්දේශ ඒකමතිකව අනුමත කරන ලදී.

- පුරප්පාඩු වූ අභියාචනාධිකරණ විනිශ්චයකාර ධුරය සඳහා මහාධිකරණ විනිශ්චයකාරවරයන් වන ඩී. එෆ්. එච්. ගුණවර්ධන මහතා සහ ඒ. කේ. එම්. පටබැඳිගේ මහතා පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශ 2025 ජුනි 13 වන දින පැවති රැස්වීමේදී, සභාව විසින් සලකා බලන ලදී.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (4) ව්‍යවස්ථාව යටතේ ගරු අග්‍රවිනිශ්චයකාරතුමා වෙතින් ලබාගත් අදහස් ද සමඟ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශ සලකා බැලූ සභාව විසින්, මහාධිකරණ විනිශ්චයකාරවරයන් වන ඩී. එෆ්. එච්. ගුණවර්ධන මහතා සහ ඒ. කේ. එම් පටබැඳිගේ මහතා අභියාචනාධිකරණයේ විනිශ්චයකාර ධුරයට පත් කිරීමට අදාළ නිර්දේශ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

5.4. විගණකාධිපති ධූරය සඳහා පත් කිරීම

- සභාව විසින්, 2025 අප්‍රේල් 22 වන දින පැවති සිය රැස්වීමේ දී, විගණකාධිපතිවරයෙකු ස්ථිරව පත් කරන තුරු 2025.04.23 වන දින සිට දින තිහක (30) කාල පරිච්ඡේදයක් සඳහා විගණකාධිපති ධුරයේ වැඩ බැලීම සඳහා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති ජී. එච්. ඩී. ධර්මපාල මහතා පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාව යටතේ, ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී.

  සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සභාව විසින්, විගණකාධිපති ධූරය සඳහා ස්ථිර පත්වීමක් සිදු කරන තෙක්, 2025.04.23 දින සිට දින තිහක (30) කාල පරිච්ඡේදයක් සඳහා විගණකාධිපති ධූරයේ වැඩ බැලීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති ජී. එච්. ඩී. ධර්මපාල මහතා පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය අනුමත කිරීමට ඒකමතිකව තීරණය කරන ලදී.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාව යටතේ, විගණකාධිපති ධූරය සඳහා පුෂ්පික වන්දන හේවා තොණ්ඩිලගේ මහතා පත් කිරීම සඳහා ගරු ජනාධිපතිවරයාගේ නිර්දේශය 2025 මැයි 20 සහ 21 යන දිනවල පැවති සිය රැස්වීම්වලදී, සභාව විසින් සලකා බලන ලදී.

  ඊට අනුකූලව, නාමිකයාගේ ජීව දත්ත පත්‍රිකාව, ඔහු විසින් මීට පෙර ලබා ගත් වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද මෙන්ම විගණකාධිපති ධූරයට පත් කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සලකා බැලීමෙන් අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) සහ 41ඉ ව්‍යවස්ථා යටතේ, පුෂ්පික වන්දන හේවා තොණ්ඩිලගේ මහතා විගණකාධිපති ධූරයට පත් කිරීම සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාවේ සාමාජිකයින් පස් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකගේ සහායෙන් සභාව විසින් අනුමත නොකරන ලදී.

- විගණකාධිපති ධූරයට ස්ථිර පත්වීමක් සිදු කරන තුරු 2025.05.23 දින සිට මාස 06 ක කාලයක් සඳහා විගණකාධිපති ධූරයේ වැඩ බැලීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති ජී. එච්. ඩී. ධර්මපාල මහතා පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාව යටතේ, ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිර්දේශය, සභාව විසින් 2025 මැයි 22 වැනි දින පැවති සිය රැස්වීමේදී සලකා බලන ලදී.

  නාමිකයා දැනට විගණකාධිපති ධූරයේ වැඩ බැලීම සිදු කරනු ලබමින් සිටින බවත් ඔහුගේ වත්මන් ධූරයේ ධුර කාලය 2025.04.23 දින සිට ක්‍රියාත්මක වන දින 30ක කාල පරිච්ඡේදයක් සඳහා වන බවත්, එය 2025.05.23 වැනි දින සිට අවසන් වන බවත් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

  ඊට අනුකූලව, විගණකාධිපති ධූරය සඳහා ස්ථිර පත්වීමක් සිදු කරන තෙක්, 2025.05.23 දින සිට මාස 06 ක කාලයක් විගණකාධිපති ධූරයේ වැඩ බැලීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති ජී. එච්. ඩී. ධර්මපාල මහතා පත් කිරීම සඳහා වූ ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය, සභාවේ

සාමාජිකයින් පස් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (2) ව්‍යවස්ථාව යටතේ අනුමත කරන ලදී.

6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර වෙනත් ලිඛිත නීති මඟින් සභාව වෙත පනවන ලද හෝ පවරන ලද කාර්ය සහ කර්තව්‍යයන් ඉටු කිරීම

6.1. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට සාමාජිකයින් පත් කිරීම

- 2025 මාර්තු 12 වැනි දින පැවති රැස්වීමේදී, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සාමාජික ධුරය සඳහා නිමල් කොටවෙලගෙදර මහතා, තිලක් පතිරගේ මහතා, බල මානගේ සුමනරත්න මහතා, සමීර උදයන්ත අල්විස් මහතා සහ නූර් රිස්නා අනීස් මහත්මිය පත් කිරීමට ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ නිර්දේශය සභාවේ එකඟතාවය ලබා ගැනීම පිණිස ගරු අමාත්‍යතුමා වෙතින් ලද සන්නිවේදනය සභාව විසින් සලකා බලන ලදී.

  මෙම මණ්ඩලයෙහි දැනට සාමාජිකයින් පස් දෙනෙකු කටයුතු කරමින් සිටින බවත්, එකී මණ්ඩලයට නව සාමාජිකයින් පත් කිරීමට පෙර 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 5(2) වගන්තිය ප්‍රකාරව, ඔවුන් සාමාජික ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීමෙන් ඔවුන්ගේ ධුර පුරප්පාඩු විය හැකි බව සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

  එම නිසා, ඉහත සඳහන් සභාවේ නිරීක්ෂණය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කිරීමට සභාව විසින් තීරණය කරන ලදී.

6.2. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට (OMP) සාමාජිකයින් පත් කිරීම

- සභාව විසින්, 2025 මාර්තු 12 වැනි දින පවත්වන ලද සිය රැස්වීමේදී, එච්.එම්.එම්.බී. ජයවර්ධන මහතා සහ පී.එම්.ඩබ්ලිව්. සම්පත් පෙරේරා මහතා, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ (OMP) සාමාජික ධුරයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් සාමාජික ධුරයෙහි ඇතිවූ පුරප්පාඩු සඳහා පත්කිරීම් සම්බන්ධයෙන්, කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සඳහා 2025 පෙබරවාරි 05 සහ 11 වැනි දිනයන් හිදී පැවැත් වූ සම්මුඛ පරීක්ෂණ හා සම්බන්ධ ඇගයීම් වාර්තා සභාව විසින් සලකා බලන ලදී.

  2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතෙහි දක්වා ඇති පරිදි එහි කාර්යය සහ කර්තව්‍යයන්හි ස්වභාවය සැලකිල්ලට ගෙන, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වත්මන් සංයුතිය සභාව විසින් සමාලෝචනය කරන ලද අතර කාර්යාලයෙහි ප්‍රමාණවත් බහුත්ත්ව නියෝජනය සහතික කිරීමේ වැදගත්කම අවධාරණය කරන ලදී.

  අයදුම්කරුවන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය සලකා බැලීමෙන් අනතුරුව, පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජික ධුරයට පත් කිරීම සඳහා සභාව විසින් ඒකමතිකව මිරාක් විජේසේකර රහීම් මහතා නිර්දේශ කරන ලද අතර, සභාවේ බහුතරය විසින් වඩිවේල් ක්‍රිෂ්ණමූර්ති මහතා පත් කිරීම සඳහා නිර්දේශ කරන ලදී.

6.3. හානිපූරණය සඳහා වන කාර්යාලයට සාමාජිකයින් පත් කිරීම

- 2025 ජූනි 12 වන දින සිට හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයෙකුගේ ධුර කාලය අවසන් වීම හේතුවෙන් සාමාජික ධුරයේ පුරප්පාඩුවක් ඇතිවී තිබීමත් ඉදිරි මාස 02ක කාල පරිච්ඡේදය තුළ 2025 ජූලි 06 වැනි දින සහ 2025 අගෝස්තු 25 වැනි දින තවත් පුරප්පාඩු තුනක් (03) ඇති වීමට නියමිත බවටත් 2025 ජූනි 18 වන දින පැවති රැස්වීමේදී, සභාවේ අවධානය යොමු විය.

  ඊට අනුකූලව, 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාල පනත යටතේ, හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජික ධුරයේ පවතින පුරප්පාඩුව සහ ඉදිරියේදී ඇති වීමට නියමිත පුරප්පාඩු සඳහා පත් කිරීමට සලකා බැලීම සඳහා සුදුසුකම් සහිත තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවීමට සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

6.4. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික තනතුරට පත් කිරීම

- විශ්‍රාමික විනිශ්චයකාර පී. රෝහිණී වල්ගම මහත්මිය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයෙන් ඉල්ලා අස්වීම පිළිබඳව සභාව වෙත දැනුම් දෙන ලදී. ඊට අනුකූලව, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 12 (1) (ආ) වගන්තිය ප්‍රකාරව, ප්‍රකාශකවරුන්ගේ, කර්තෘවරුන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ සංවිධාන යන ප්‍රභේදය යටතේ සිදුවූ එම ඉල්ලා අස්වීම හේතුවෙන් කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ පුරප්පාඩුවක් ඇති වී තිබෙන බවට සභවේ අවධානය යොමුවන ලදී. ඊට අනුකූලව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීම සඳහා සලකා බලනු ලැබීමට එවැනි සංවිධාන වලින් නාමයෝජනා කැඳවීමට සභාව විසින් පුවත්පත් දැන්වීමක් පළ කරන ලදී.

  ඊට අනුකූලව, එම දැන්වීම පරිදි නාමයෝජනා ඉදිරිපත් කරන ලද තැනැත්තන්ගේ සුදුසුකම්, යෝග්‍යතාවය සහ කාර්ය සාධනය සලකා බැලීමෙන් අනතුරුව, සභාව විසින් 2025 මාර්තු 12 වැනි දින පැවති සිය රැස්වීමේදී, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 12 වගන්තිය ප්‍රකාරව, විශ්‍රාමික විනිශ්චයකාර දුෂ්මන්ත නිහාල් සමරකෝන් මහතා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම සඳහා නිර්දේශ කිරීමට ඒකමතිකව තීරණය කරන ලදී.

- විශ්‍රාමික විනිශ්චයකාර උපාලි අබේරත්න මහතා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සභාපති/ සාමාජික ධුරයෙන් ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් සභාව වෙත දැනුම් දෙන ලදී.

  ඊට අනුකූලව, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීම පිළිබඳ අයිතිවාසිකම පනත යටතේ, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීම සඳහා නිර්දේශ කරනු ලැබීමට සුදුසු තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවමින් 2025.03.21 දිනැති පුවත්පත් දැන්වීමක් සභාව විසින් පළ කරන ලදී. එම දැන්වීමට අනුව, නියමිත ආකෘතියට අනුව ඉදිරිපත් කරන ලද අයදුම්පත් විස්සක් (20) සහ නියමිත ආකෘතියට අනුව ඉදිරිපත් නොකරන ලද අයදුම්පත් පහක් (05) ලැබී තිබුණි. ඊට අනුකූලව, සභාව විසින්, 2025 අප්‍රේල් 22 වැනි දින පැවති

සිය රැස්වීමේදී, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 12 (2) අ (iii) සහ (v) වගන්ති ප්‍රකාරව සභාව විසින් නිර්දේශ ඉදිරිපත් කිරීමේදී, නිර්දේශ කරනු ලබන තැනැත්තන් කිසිදු රාජ්‍ය හෝ අධිකරණ ධුරයක් හෝ වෙනත් ලාභදායී ධුරයක් දරන තැනැත්තකු නොවන බවට හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යනු නොලබන හෝ යම් වෘත්තියක නොයෙදෙන බවටත් සභාව විසින් සහතික කරනු ලැබිය යුතු බැවින් එකී නීතිමය ප්‍රතිපාදනයට අනුකූලව කටයුතු කිරීමට එකඟ වන්නේද යන්න පිළිබඳව අයදුම්කරුවන්ගෙන් විමසීමට සභාව විසින් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව, සභාව විසින්, 2025 මැයි 20 වැනි දින පැවැති සිය රැස්වීමේදී, අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමට හා 2025.06.04 වැනි දින සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා තීරණය කරන ලදී.

සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සභාව විසින්, 2025 ජුනි 18 වන දින පැවති රැස්වීමේදී මෙම කරුණ සම්බන්ධයෙන් මීළඟ රැස්වීමේදී වැඩිදුරටත් සලකා බැලීමට තීරණය කරන ලදී.

6.5. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම

- සභාව විසින්, 2024 දෙසැම්බර් 31 වැනි දින පැවති සිය රැස්වීමේදී තීරණය කරන ලද පරිදි, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජික ධුරය සඳහා නිර්දේශිත නාමිකයන් සමඟ සාකච්ඡාවක් පවත්වනු ලැබිණි.

  සභාව විසින් 2025 ජනවාරි 03 වැනි දින පැවති සිය රැස්වීමේදී නාමයෝජනා සලකා බලන ලද අතර, එහෙත් නාමිකයන්ගේ යෝග්‍යතාව පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වගකීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන විශේෂඥතාවය සහ නිපුණතා සැලකිල්ලට ගනිමින්, විනිශ්චයකාර ඩබ්ලිව්. ඒ. කළුආරච්චි මහතා සහ මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ඒ. එස්. රොද්‍රිගෝ මහතා විසින් පත්වීම් පිළි නොගැනීම හේතුවෙන් පුරප්පාඩු වී තිබූ ධුරය සඳහා, කරන ලද නාමයෝජනා වෙනුවට නව නාමයෝජනා ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටීමට තීරණය කරන ලදී.

- විනිශ්චයකාර ඩබ්ලිව්. ඒ. කළුආරච්චි මහතා සහ මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ඒ. එස්. රොද්‍රිගෝ මහතා විසින් පත්වීම් පිළි නොගැනීම හේතුවෙන් පුරප්පාඩු වූ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජික ධුරය සඳහා මහාචාර්ය එල්. සමරනායක මහතා සහ ජී. ඒ. එස්. ගලගම ආරච්චි මහතා පත් කිරීම සඳහා ගරු මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයට සභාවේ එකඟතාව විමසමින් ගරු අමාත්‍යතුමා විසින් එවන ලද සන්නිවේදනය සභාව විසින් සලකා බලන ලදී.

  එම නිර්දේශ සලකා බැලීමෙන් පසු, 2025 අප්‍රේල් 22 වන දින පැවති රැස්වීමේදී, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 5 වගන්තිය ප්‍රකාරව නිපුණතා, සුදුසුකම් සහ නුසුදුසුකම් සැලකිල්ලට ගනිමින්, සභාව විසින් මහාචාර්ය එල්. සමරනායක මහතා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගෙන් ලද නාමයෝජනාවට ඒකමතිකව එකඟ විය. එහෙත්, ඉතිරි පුරප්පාඩුව සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත්

කිරීම සඳහා නීති ක්ෂේත්‍රය නියෝජනය කරන වෙනත් නාමයෝජනාවක් ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටීමට සභාව විසින් තීරණය කරන ලදී.

- ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට, ඒ. ටී. හේවගේ මහතා පත් කිරීමට ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ලද නිර්දේශය සඳහා සභාවේ එකඟතාව විමසමින්, ගරු අමාත්‍යතුමා විසින් එවන ලද සන්නිවේදනය සභාව විසින් 2025 ජූනි 18 වැනි දින පැවති රැස්වීමේදී සලකා බලන ලදී. මෙම කරුණ පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 5 වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීමට නාමිකයා විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා තිබෙද යන්න සහ පත් කිරීමට නුසුදුසු අයෙක් නොවන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා නාමිකයාගෙන් දිවුරුම් ප්‍රකාශයක් ලබා ගැනීමට සභාව එකඟ වූ අතර, සභාව සමඟ සාකච්ඡාවක් සඳහා නාමිකයාට ආරාධනා කිරීමටද සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

6.6. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම සඳහා සභාවේ නිර්දේශය

- 2024.12.30 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ සවිස්තරාත්මක ඇගයීම් වාර්තාවක් සභාව විසින් සලකා බලන ලද අතර, සභාව විසින් සම්මත කරන ලද තෝරා ගැනීමේ නිර්ණායක සහ ක්‍රියා පටිපාටියට අනුව සභාවේ සියලු සාමාජිකයින් විසින් සියලුම අයදුම්කරුවන් තවදුරටත් ඇගයීමට ලක් කරන ලදී.

  දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ කරනු ලැබිය යුතු අයදුම්කරු සම්බන්ධයෙන් ඡන්දයක් පැවැත්වීමට සභාව විසින් තීරණය කරන ලදී.

  ඊට අනුකූලව, 2023 අංක 28 දරන පනතින් සංශෝධිත 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය සඳහා රංග ශ්‍රීනාත් අබේවික්‍රම දිසානායක මහතා නිර්දේශ කිරීමට 2025 ජනවාරි 07 වැනි දින පැවති රැස්වීමේදී, සභාවේ බහුතරය විසින් තීරණය කරන ලදී.

6.7. කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට සාමාජිකයින් පත් කිරීම

- කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ තනතුරු පහක් සඳහා සාමාජිකයින් පත් කිරීමට නිර්දේශ කරනු ලැබීමට සුදුසු තැනැත්තන්ගෙන් අයදුම්පත්/නාමයෝජනා කැඳවීම සඳහා සභාව විසින්, පුවත්පත් දැන්වීමක් පළ කරන ලදී. එම දැන්වීමට අනුව, ප්‍රමාද වී එවන ලද අයදුම්පත්/නාමයෝජනා, මුල් පිටපතට අමතර එවන ලද අයදුම්පත්/නාමයෝජනා පිටපත්, අසම්පූර්ණ අයදුම්පත්/නාමයෝජනා සහ නියමිත ආකෘතියට අනුව ඉදිරිපත් නොකරන ලද අයදුම්පත්/නාමයෝජනා ඇතුළුව ලැබී තිබුණු මුළු අයදුම්පත්/නාමයෝජනා සංඛ්‍යාව එක්සිය අසූ එකක් (181) විය.

සාකච්ඡා කිරීමෙන් අනතුරුව, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව සභාව විසින් අයදුම්කරුවන්/ නාමිකයන් ඔවුන්ගේ විශේෂඥතා ක්ෂේත්‍රය (නීතිය හෝ ව්‍යවස්ථාකරණය, වෘත්තීය සමිති, කළමනාකරණය සහ පරිපාලනය, ආර්ථික සංවර්ධනය, සෞඛ්‍යය, අධ්‍යාපනය, කාන්තාවන් සවිබල ගැන්වීම හෝ කාන්තාවන්ගේ රැකියා අවස්ථා ඉහළ නැංවීමට කැපවූ) මත පදනම්ව සභාව විසින් වර්ගීකරණය සිදු කරන ලදී.

ඊට අනුකූලව, අයදුම්කරුවන්ගේ/ නාමිකයන්ගේ නිපුණතා, සුදුසුකම් සහ යෝග්‍යතාවය සලකා බැලීමෙන් පසු, සභාව විසින්, 2025 ජුනි 18 වැනි දින පැවති සිය රැස්වීමේදී, අයදුම්කරුවන්/ නාමිකයන් කෙටි ලැයිස්තුගත කරන ලද අතර කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන්/ නාමිකයන් 2025 ජූලි 09 වැනි දින සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවීමට තීරණය කරන ලදී.

7. සභාවේ කාර්යය සහ කර්තව්‍යයන් කිරීම සහ ඉටු කිරීම සම්බන්ධ රීති සම්පාදනය කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඵ (3) ව්‍යවස්ථාව මඟින් නියම කර ඇති පරිදි, සභාව විසින් සිය කාර්යය සහ කර්තව්‍යයන් කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් කෙටුම්පත් කරන ලද රීති නැවත සලකා බැලීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

ඉන් අනතුරුව, 2025 මැයි 20 වැනි දින පැවති රැස්වීමේදී, සභාව විසින්, 2005 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පනත යටතේ අධිකරණ පත් කිරීම් සිදු කිරීමේදී එක්සත් රාජධානිය අනුගමනය කරන ක්‍රියාවලිය පිළිබඳව විනිශ්චයකාර බ්‍රෙන්ඩා මාජෝරී හේල්, එක්සත් රාජධානියේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු අග්‍රවිනිශ්චයකාරවරිය වන රිච්මන්ඩ්හි හේල් ආර්යාව සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී .

කෙටුම්පත් කරන ලද රීති, ගරු නීතිපතිතුමාගේ නිරීක්ෂණ සඳහා යැවීමට 2025 ජුනි 18 වැනි දින පැවති රැස්වීමේදී, සභාව විසින් තීරණය කරන ලදී. සභාවේ සාමාජිකයින් සඳහා නෛතික නියෝජනය සම්බන්ධයෙන් ලැබීමට නියමිත ප්‍රතිපත්තිමය තීරණයේ ප්‍රතිඵල සලකා බැලීමටත්, එම ප්‍රතිපත්තිමය තීරණය ගනු ලැබීමෙන් පසු එය රීති තුළට ඇතුළත් කිරීමටද සභාව විසින් තීරණය කරන ලදී.

8. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ යොමු කරනු ලබන තොරතුරු ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු සඳහා පහත ඉල්ලීම් සංඛ්‍යාවක් ලැබී තිබෙන අතර, මෙහි දක්වා ඇති පරිදි ප්‍රතිචාර යොමු කර ඇත:-

ලැබුණු තොරතුරු ඉල්ලීම් ගණන	2
තොරතුරු සම්පූර්ණයෙන්/අර්ධ වශයෙන් සපයන ලද ඉල්ලීම් ගණන	2
ප්‍රතික්ෂේප හෝ නිෂ්ප්‍රභා කරන ලද ඉල්ලීම් ගණන	0
අභියාචනා ගණන	0
තොරතුරු සපයන ලද අභියාචනා ගණන	0
ප්‍රතික්ෂේප වූ අභියාචනා ගණන	0

9. සභාවේ සාමාජිකයන් වගඋත්තරකරුවන් ලෙස සඳහන් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරනු ලැබ ඇති මූලික අයිතිවාසිකම් අයදුම්පත්:-

i. SC FR 29/2025

--//--